රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 04/2011(i)

මගේ අංකය :CS /ICTS/01/Abs. Committee
රාජ්‍ය පරිපාලන හා ස්වදේශ
කටයුතු අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07.
2012.08.16

සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්,
දෙපාර්තමේන්තු ප්‍රධානීන් ,
දිස්ත්‍රික් ලේකම්වරුන් ,
ප්‍රදේශීය ලේකම්වරුන් වෙත.

**ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයට අන්තර්ග්‍රහණය කිරීම.**

අංක 1631/20 හා 2009 දෙසැම්බර් 09 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ 2009 දෙසැම්බර් 08 දිනැති ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවා ව්‍යවස්ථා සංග්‍රහය ක්‍රියාත්මක කිරීම පිළිබඳව නිකුත්කළ 2011.02.15 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 04/2011 හි 5.1(i)(අ) , 5.3 (ii) වගන්තීන් සංශෝධනය කර, 2.5, 3.3 යනුවෙන් නව වගන්ති 2ක් ඇතුළත් කරමින් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමයන් අනුව පහත සඳහන් පරිදි සංශෝධනය කෙරේ.

02. 5.1 (i) (අ) උප වගන්තිය :

**"තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ 111 පන්තියට අන්තර්ග්‍රහණය වීම සඳහා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවා ව්‍යවස්ථාවේ 8.1.1 (ඉ) හි සඳහන් අ.පො.ස. (සාමාන්‍ය පෙළ) අධ්‍යාපන සුදුසුකම අන්තර්කාලය තුළ දී ඕනෑම වාර ගණනකින් සම්පූර්ණ කිරීමට හැකිවනු ඇත."**

03. 5.3 (ii) වගන්තිය :

**"සේවා ව්‍යවස්ථාවේ 8.6.1 (ඉ) වගන්තියේ පරිදි වන සුදුසුකම් සම්පූර්ණ කර නොමැති සේවයේ 1 පන්තියට අන්තර්ග්‍රහණය වීමට අයදුම් කර ඇති 2009.07.01 දිනට තොරතුරු තාක්ෂණය හෝ පරිගණක විෂයට අදාල තනතුරක, SL 1-2006 හෝ ඊට අනුරූපී වැටුප් පරිමාණයක වසර 15ක සේවා කාලයක් සම්පූර්ණ කර නොමැති නිලධාරීන්ට ලබාදී ඇති සහන කාලය තුළ එනම් 2013.12.31 දිනට පෙර තොරතුරු තාක්ෂණ පශ්චාත් උපාධි ඩිප්ලෝමා සුදුසුකම ලබා ගැනීමෙන් පසු ඔවුන් අන්තර්ග්‍රහණය කිරීම සඳහා සලකා බලනු ඇත."**

04. 2.5 වගන්තිය :

නිශ්චිත වශයෙන්ම පරිගනක / තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ විෂයට අදාල තනතුරු සඳහා 2009.**12.09** දින වන විට විධිමත්ව බඳවාගෙන ඇති නමුත් මේ වන තෙක් තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයට අන්තර්ග්‍රහණය වීමට මනාපය පළ නොකළ සියළුම නිලධරයන් සේවාවට අන්තර්ග්‍රහණය සඳහා 2012.11.08 දිනට පෙර මනාපය පළ කළ යුතුය. මනාපය පළ කිරීම අංක 1631/20 දරන 2009.12.09 දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රයේ 1 වැනි පරිශිෂ්ඨයට අනුව නියමිත දිනට පෙර ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙත යොමු කළ යුතුය.

05. 3.3 වගන්තිය :

2012.11.08 දින වන විට මනාපය පළ නොකරන නිලධාරීන් සේවා ව්‍යවස්ථාවේ 11.2 වගන්තිය අනුව අනිවාර්ය විශ්‍රාම ගැන්වීමකට යටත් වන අතර එම විශ්‍රාම ගැන්වීම අදාල පත්කිරීම් බලධාරීන් විසින් සිදු කළ යුතුය.

පී.බී.අබේකෝන්

ලේකම්

රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය